# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 27 දරන
# ඉඩම් සංවර්ධන (සංශෝධන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1081 මැයි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 5 වන දින]

එල්.ඩී.—ඕ. 2/80

ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන ඇලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 27 දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 2 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *464 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) "ලංකා කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව" යන්නෙහි අර්ථ කථනය අත් හැරීමෙන් ;

(ආ) "අන් සතු කිරීම" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ලංකා බැංකුව" යන්නෙන් ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ ; ';

(ඇ) "ලංකා රාජ්‍ය උකස් බැංකුව" යන්නෙහි අර්ථ කථනය අත් හැරීමෙන් ;

(ඈ) "රජයේ ඉඩම්" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ලංකා සංවර්ධන මුදල් සංස්ථාව" යන්නෙන්, සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංස්ථාව අදහස් වේ : ';

(ඉ) "දිසාපති" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"දිසාපති" යන්නට, අතිරේක දිසාපති, සහකාර දිසාපති, අතිරේක සහකාර දිසාපති, සහකාර ඉඩම් කොමසාරිස්, දිසා ඉඩම් නිලධරයා සහ මේ ආඥාපනතේ යම් විශේෂ කරුණක් හෝ විධිවිධානයක් සම්බන්ධයෙන් දිසාපති විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු ද ඇතුළත් වේ ; ';

(ඊ) "ප්‍රදානය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ගොඩ ඉඩම්" යන්නෙන්, වාරිමාර්ග පහසුකම් සලසනු නොලැබූ ඉඩම් අදහස් වේ ; ';

2—ජ 55112—11,700 (81/02)

(ට) "ඉඩම් කොටස" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"වාරි මාර්ග පහසුකම් සලසන ලද ඉඩම්" යන්නෙන්, වාරි මාර්ග ආඥාපනතේ අර්ථ කථනය කර ඇති පරිදි යම් "වාරිමාර්ග කටයුතු" කිසිවක් මගින් ප්‍රයෝජනය ලැබූ යම් ඉඩම් අදහස් වේ. ;';

(ඨ) "ඉඩම් කොමසාරිස්වරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"ඉඩම් කොමසාරිස්වරයා" යන්නෙන්, මේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිල ධරයා අදහස් වන අතර, ඊට යම් අතිරේක ඉඩම් කොමසාරිස්වරයකු, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් වරයකු සහ මේ ආඥාපනත යටතේ කිසියම් විශේෂ කාරණයක් නැතහොත් විධිවිධානයක් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ඔහුගේ දෙපාර්ත මේන්තුවේ වෙනත් යම් නිලධරයකු ඇතු ළත් වේ ;';

(ඩ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභා වක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනු රූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල. කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;';

(ඪ) "අවම භාගය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" යන්නෙන්, 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ ;';

(ණ) "අයිතිකරු" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

'"අයිතිකරු" යන්නෙන්, මේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රයකින් හෝ ප්‍රදාන පත්‍රයක් යටතේ ඉඩම් කොටසකට අයිතිය ලබා සිටින ඉඩම් කොටසක අයිතිකරු අදහස් වන අතර, 19 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ තමා විසින් ගෙවනු ලැබිය යුතු සියලු මුදල් ගෙවා ඇත්තා වූ ද, අවසර පත්‍රයෙහි සඳහන්

වෙනත් සියලු කොන්දේසි අනුව ක්‍රියා කර ඇත්තා වූ ද, අවසර පත්‍ර දරන්නකු ද ඊට ඇතුළත් වේ; ';

(ඔ) "සාම නිලධරයා" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

' "සාම නිලධරයා" යන්නට, පොලිස් නිලධරයකු සහ පොලිස් රාජකාරි ඉටු කිරීම සඳහා දිසාපතිවරයකු විසින් ලියවිල්ලකින් පත් කරන ලද ග්‍රාම සේවා නිලධාරීන් ඇතුළත් වේ; '; සහ

(ක) "යෝජනා ක්‍රමය" යන අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

' "රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුව අදහස් වේ. '.

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන සහ III වන පරිච්ඡේද ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ II වන සහ III වන පරිච්ඡේද මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේද ආදේශ කරනු ලැබේ :—

"II වන පරිච්ඡේදය

රජයේ ඉඩම් වෙන් කර ලකුණු කිරීම

රජයේ ඉඩම වෙන් කර ලකුණු කරනු ලැබිය හැකි කාර්ය.

8. ඉඩම් කොමසාරිස්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත් ව, දිසාපතිවරයා විසින් රජයේ ඉඩම්, පහත දැක්වෙන කාර්ය අතුරින් කිසිවක් හෝ වැඩි ගණනක් හෝ සඳහා වෙන් කර ලකුණු කරනු ලැබිය හැකි ය :—

(අ) ගම් පුළුල් කිරීම ;

(ආ) ගම්බද කැලෑ ;

(ඇ) ගම් තණ බිම් ;

(ඈ) මෙහි සඳහන් කර නොමැති ගම් කාර්ය ;

(ඉ) නැවත ජනාවාස කිරීම් ;

(ඊ) දිය උල්පත් සහ ජල මාර්ග ආරක්ෂා කිරීම ;

(උ) පස සේදී යාම වැළැක්වීම ;

(ඌ) රක්ෂිත කැලෑව ;

(එ) ආණ්ඩුවේ ගොඩනැගිලි, පාරවල් හෝ වැඩ ඇතුළත් ආණ්ඩුවේ කාර්ය ;

(ඒ) දේශගුණික හා වෙනත් පරිසර විද්‍යාත්මක කාර්ය සඳහා සහ පාරිසරික ආරක්ෂාව සඳහා රක්ෂිත ප්‍රදේශ ;

(ඔ) පුරා විද්‍යාත්මක සහ ඓතිහාසික වැදගත් කමක් ඇති දේවල් ආරක්ෂා කිරීම ;

(ඕ) පළාත් පාලන ආයතනවල අවශ්‍යතා ;

(ඛ) නගර සංවර්ධනය කිරීම ;

(ග) ඇතැම් පන්තිවල තැනැත්තන්ට බිම් සතු කිරීම ;

(ච) ප්‍රදේශයේ ආරක්ෂාව, සංරක්ෂණය සහ සංවර්ධනය පිළිබඳව සැලකිලිමත් ව, නියම කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්යයක්.

දිසාපතිවරයා විසින් යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළියෙළ කළ යුතු බව.

9. 8 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව, රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබූ විට, දිසාපතිවරයා විසින්—

(අ) වෙන් කර ලකුණු කරනු ලැබූ ප්‍රදේශ සහ ඒ ප්‍රදේශවල ඉඩම් පිළිවෙළින් වෙන් කරනු ලැබූ කාර්ය, නිශ්චිතව දැක්වෙන යෝජනා ක්‍රමයක් ;

(ආ) යෝජනා ක්‍රමයෙහි නිශ්චිතව සඳහන් වෙන් කර ලකුණු කරනු ලැබූ ප්‍රදේශ දැක්වෙන දළ රූප සටහනක්

පිළියෙළ කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

9 වන වගන්තිය යටතේ තමා විසින් පිළියෙළ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවෙහි නිරීක්ෂණ සඳහා ඒ කමිටුව වෙත යැවීම දිසාපතිවරයාගේ කාර්යය බව.

10. 9 වන වගන්තිය යටතේ තමා විසින් පිළියෙළ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන, දිසාපතිවරයා විසින්, ස්වකීය පරිපාලන දිස්ත්‍රික්කයෙහි පිහිටුවා ඇති දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව වෙත, ඒ කමිටුව විසින් සලකා බලනු ලැබීම සඳහා යවනු ලැබිය යුතු ය.

යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ස්වකීය නිරීක්ෂණ සමඟ දින තිහක් ඇතුළත දී ආපසු යැවීම දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුවේ කාර්යය බව.

11. දිසාපතිවරයාගෙන් යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ලැබී දින තිහක් ඇතුළත, දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින්, ඒ යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව එම කමිටුවේ නිරීක්ෂණ සමඟ එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන දිසාපතිවරයා වෙත ආපසු යැවිය යුතු ය.

දිසාපතිවරයා විසින් පිළියෙළ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන අවශ්‍ය වුවහොත්, සුළු වශයෙන් වෙනස් කොට, ඉඩම් කොමසාරිස්වරයා වෙත යැවිය යුතු බව.

12. 9 වන වගන්තිය යටතේ දිසාපතිවරයා විසින් පිළියෙළ කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව විසින් කරන ලද නිර්දේශ සලකා බැලීමෙන් පසුව, එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන සුළු වශයෙන් වෙනස් කිරීම් අවශ්‍ය යයි දිසාපතිවරයා සලකනු ලැබුවහොත්, දිසාපතිවරයා විසින් එය සුළු වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය. ඉක්බිතිව, අවස්ථාවෝචිත පරිදි, යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන නැතහොත් සුළු වශයෙන් වෙනස් කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන, දිසාපතිවරයා විසින් පිළියෙළ කොට ඒ දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව වෙත යවන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන පිළිබඳව ඒ කමිටුව විසින් කරන ලද නිර්දේශ ද සමග දිසාපතිවරයා විසින් ඉඩම් කොමසාරිස්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

යෝජනා ක්‍රමය ස්ථිර කිරීමට හෝ වැඩිදුර උපදෙස් නිකුත් කිරීමට ඉඩම් කොමසාරිස්වරයාට ඇති බලය.

13. (1) 12 වන වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ලැබුණු විට, ඉඩම් කොමසාරිස්වරයා විසින් ඒ යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන ස්ථිර කරනු ලැබිය හැකි ය; එසේ නැතහොත් වෙන් කර ලකුණු කිරීම හෝ යෝජනා ක්‍රමය හෝ දළ රූප සටහන සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්වරයා අවශ්‍ය යයි සලකන වැඩිදුර විධාන හෝ උපදෙස් හෝ දිසාපතිවරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය; තව ද, දිසාපතිවරයා විසින් ඒ විධාන හෝ උපදෙස් පිළිපැදිය යුතු අතර, ඒවා ක්‍රියාත්මක කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා විසින් නිකුත් කරන ලද විධාන නැතහොත් උපදෙස් ක්‍රියාත්මක කර ඇති බවට ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් අවස්ථාවෝචිත පරිදි, එම යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන හෝ සුළු වශයෙන් වෙනස් කරන ලද යෝජනා ක්‍රමය සහ දළ රූප සටහන හෝ ස්ථිර කරනු ලැබිය හැකි ය.

ස්ථිර කිරීම දැනුම් දීම.

14. ඉඩම් කොමසාරිස්වරයා වෙත 12 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් යෝජනා ක්‍රමයක් ඔහු විසින් ස්ථිර කරන ලද බව, නියම කරනු ලබන යම් ආකාරයකට දැනුම් දෙනු ලැබිය යුතු ය.

දළ රූප සටහන පරීක්ෂා කිරීමට මහජනයාට ඇති අයිතිය.

15. 14 වන වගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ විට, ඒ දැන්වීමේ සඳහන් වෙන් කර ලකුණු කිරීමේ සැලැස්ම දක්වෙන දළ රූප සටහන දිස්ත්‍රික්කයේ කචේරියේ දී හෝ සර්වේයර්

ජනරාල්වරයාගේ කාර්යාලයේ දී හෝ ගාස්තුවක් නොමැතිව පරීක්ෂා කිරීමට මහජනයා අතුරින් සෑම තැනැත්තකුට ම හිමිකම ඇත්තේ ය.

ඇතැම් අවස්ථාවල දී අමාත්‍යවරයාගේ ද අනෙක් අවස්ථාවල දී ඉඩම් කොමසාරිස්වරයාගේ ද අනුමතය ඇතිව හැර සැලැස්ම් සුළු වශයෙන් වෙනස් නොකළ යුතු බව.

16. ඉඩම් කොමසාරිස්වරයා විසින් ස්ථිර කරන ලද කිසිම සැලැස්මක් 8 වන වගන්තියේ (අ) ඡේදයේ සිට (ඉ) ඡේදය දක්වා වූ ඡේදයන්හි සඳහන් යම් කාර්යයක් සඳහා වෙන් කර ලකුණු කරන ලද ඉඩමක්, ඒ වගන්තියේ (ග) ඡේදයෙහි සඳහන් කාර්ය සඳහා වෙන් කර ලකුණු කරනු ලැබීමට හෝ උපයෝගී කර ගනු ලැබීමට හෝ හැකි කරනු පිණිස, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ අමාත්‍යවරයාගේ අනුමතය සහ කැමැත්ත ඇතිව හැර, නොකළ යුතු ය:

එසේ වුව ද අමාත්‍යවරයාගේ අනුමතය සහ කැමැත්ත අවශ්‍ය නොවන සැලැස්මක් සම්බන්ධයෙන් යම් සුළු වශයෙන් වෙනස් කිරීමක් හෝ වෙනස් කිරීමක් ඉඩම් කොමසාරිස්වරයාගේ ලිඛිත අධිකාරය මත ක්‍රියාත්මක කළ හැකි ය.

අන් සතු කිරීමට පෙර වෙන් කර ලකුණු කිරීම අවශ්‍ය නොවන බව.

17. රජයේ ඉඩම් වෙන් කර ලකුණු කරනු ලැබුව ද නොලැබුව ද අන් සතු කරනු ලැබිය හැකි ය.

වෙන් කර ලකුණු කරනු නොලැබූ ඉඩම අන්සතු කරනු ලැබූ විට වෙන් කර ලකුණු කරණු ලැබූ ලෙස සැලකිය යුතු බව.

18. අන් සතු කරනු ලැබූ වෙන් කර ලකුණු කරනු නොලැබූ ඉඩමක් අන්සතු කරනු ලැබූ කොටස අයත් වන්නේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තා අයත් වන පංතියේ තැනැත්තන්ට අන්සතු කිරීම සඳහා වෙන් කර ලකුණු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන පරිච්ඡේදය

## රජයේ ඉඩම් අන්සතු කිරීම

රජයේ ඉඩම් අන් සතු කිරීමේ ආකාරය.

19. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට රජයේ ඉඩම් අන්සතු කිරීම, මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති ආකාරයට ක්‍රියාත්මක කළ යුතු ය.

(2) එවැනි සෑම තැනැත්තකු විසින් ම, පළමු වන අවස්ථාවේ දී ඒ තැනැත්තාට ඉඩමෙහි පදිංචි වීමට බලය දෙන්නාවූ අවසර පත්‍රයක් ලබා ගත යුතු ය. යම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු වාර්ෂික වාරිකය ගෙවීමෙන් පසු ඒ එක් එක් වර්ෂය සඳහා ඉතිරිව ඇති ගැණුම් මුදලේ ඉතිරියෙන් සියයට හතරක් නොඉක්මවන්නා වූ අනුප්‍රමාණයක් අනුව ගණන් බලනු ලබන ගැණුම් මුදල මත ලැබිය යුතු පොලිය ද සමග ඒ මුළු ගැණුම්

මුදල අවුරුදු දහයක කාලයක් ඇතුළත, අවසර පත්‍ර දරන්නකු විසින්, ඉඩම් කොමසාරිස්වරයා විසින් තීරණය කරන ලද පරිදි වාර්ෂික වාරික වලින් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද අවසර පත්‍ර දරන්නා විසින්, නියමිත කාලසීමාව ඇතුළත ඒ සම්පූර්ණ ගෙවීම කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ පැහැර හැරීම, අසනීපවීම, බෝග පාලුවීම හෝ නොවැළැක්විය හැකි වෙනත් හේතුවක් හෝ නිසා සිදු වූ බවට ඒ අවසර පත්‍ර දරන්නා විසින් දිසාපතිවරයා සෑහීමට පත් කරයි නම්, ඒ දිසාපතිවරයා විසින් ඒ කාලසීමාව තවත් අවුරුදු දෙකකට දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) ඒ වාර්ෂික වාරික ආරම්භ විය යුතු දිනය, ඒ ගෙවීම් සංඛ්‍යාව සහ ඒ එක් එක් වාරිකය ඒ අවසර පත්‍ර දරන්නා වෙත නිකුත් කරන ලද අවසර පත්‍රයෙහි දිසාපතිවරයා විසින් යම් අවස්ථාවක දී සටහන් කරනු ලැබිය යුතු ය.

දිසාපතිවරයා විසින්, ඊට අතිරේකව, එවැනි අවසර පත්‍රයක් මත අත්සතු කරනු ලැබූ ඉඩම සර්වේයර් ජනරාල්වරයා විසින් මනිනු ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ මනින ලද ඉඩමේ (ඉම් සහ මායිම්වලට යොමු කිරීමෙන්) ප්‍රමාණය සහ විස්තරය ඒ අවසර පත්‍රයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ය. දිසාපතිවරයා විසින්, ඒ ප්‍රමාණයට සහ විස්තරයට අදාළ තොරතුරු අවසර පත්‍රයෙහි ඇතුළත් කිරීමෙන් පසු, ඒ අවසර පත්‍රය ලියාපදිංචි කිරීමට සැලැස්විය යුතු ය. එවැනි ලියාපදිංචි කිරීමක් සඳහා කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය. නැතහොත් අයකර ගනු නො ලැබිය යුතු ය.

(4) අවසර පත්‍ර දරන්නකු විසින්—

(අ) (2) වන උපවගන්තිය යටතේ ගෙවීමට ඔහුට නියම කරනු ලැබ ඇති සියලු මුදල් ඔහු විසින් ගෙවා ඇති අවස්ථාවක;

(ආ) බලපත්‍රයේ උපලේඛනයෙහි සඳහන් වෙනත් සියලු කොන්දේසි අනුව ඔහු ක්‍රියා කර ඇති අවස්ථාවක; සහ

(ඇ) (i) වාරිමාර්ග පහසුකම් සලසන ලද ඉඩමක් නම්, අවුරුදු තුනක කාලයක් සඳහා, හෝ

(ii) ගොඩබිම් නම්, අවුරුද්දක කාලයක් සඳහා

පදිංචිව සිටිනු ලැබ දිසාපතිවරයා සෑහීමට පත් වන ආකාරයකට සම්පූර්ණයෙන් සංවර්ධනය කර ඇති අවස්ථාවක,

අවසර පත්‍ර දරන්නකු පදිංචිව සිටින්නේ යම් ඉඩමක් ද, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔහුට ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද ඉහත කී කාලයට පෙර ඒ ප්‍රදාන පත්‍රය නිකුත් කිරීම පැහැර හැරීමෙන් ඒ ඉඩම සංවර්ධනය කිරීම කෙරෙහි හානිකර අන්දමින් බලපාන බවට අවසර පත්‍ර දරන්නා විසින් ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත් කරන අවස්ථාවක, ඒ කාලය ඉකුත්වීමට පෙර, ඉඩම් කොමසාරිස්වරයා විසින් ප්‍රදාන පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, යම් ඉඩමක් අන්සතු කිරීමට පෙර ඒ ඉඩම දියුණු කිරීමෙහි ලා දරන ලද වියදම් ඉඩම් කොමසාරිස්වරයා විසින් අයකර ගනු ලැබිය හැකි බවට වූ කොන්දේසියට යටත් ව, (2) වන උපවගන්තියේ සඳහන් ගැණුම් මුදල ගෙවීමෙන් ගොවිජන පන්තියට අයත් යම් අවසර පත්‍ර දරන්නකු නිදහස් කරනු ලැබිය හැකි ය.

(6) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම ප්‍රදාන පත්‍රයක ම ඒ ඉඩම් කොටසේ අයිතිකරු විසින්—

(අ) බෙදන ලද පංගුවක් හෝ ප්‍රමාණයෙන් අතුරු බෙදීමේ ඒකකයට හෝ ප්‍රදාන පත්‍රයෙහි සඳහන් අවම භාගයට හෝ අඩු ඒ ඉඩම් කට්ටියේ නොබෙදූ කොටසක් බැහැර කිරීම ; සහ

(ආ) දිසාපතිවරයාගේ පූර්ව අනුමතය ඇතිව හැර, ඒ ඉඩම බැහැර කිරීම

නොකරන බවට වූ කොන්දේසි ඇතුළත් විය යුතු ය.

රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය යුතු තැනැත්තන් තෝරා ගැනීම.

20. ආඥාපනත යටතේ රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය යුතු තැනැත්තන් තෝරා ගැනීම ඉඩම් කච්චේරියක දී කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද පහත සඳහන් අවස්ථාවල දී ඉඩම් කච්චේරියක දී හැර අන්‍යාකාරයකින් ඒ තෝරා ගැනීම කරනු ලැබිය හැකි ය:—

(අ) මේ ආඥාපනත යටතේ යම් ඉඩමක් වහාම අන්සතු කිරීම යම් ඉල්ලුම්කරුවකුගේ යහපතට යෝග්‍ය වන බව සහ ප්‍රස්තුත ඉඩම සම්බන්ධයෙන් හානිකර විය හැකි

වෙනත් සම්බන්ධතා කිසිවක් නැති බවට ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක :

එසේ වුව ද ප්‍රමාණයෙන් අක්කර අටක් ඉක්මවන්නා වූ කිසිම ඉඩමක් මේ ඡේදය යටතේ අන්සතු කරනු නොලැබිය යුතුය ; සහ

(ආ) යම් විශේෂ අවස්ථාවක් හෝ අවස්ථා වර්ග යක් සම්බන්ධයෙන් එසේ කිරීම් මහ ජන යහපත පිණිස වේ නම්, අමාත්‍ය වරයා විසින් එසේ විධාන කරනු ලබන අවස්ථාවක.

ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදන.

21. ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බවට නිවේදනය නියමිත ආකෘතියට සාරානුකූල විය යුතු අතර, නියම කරනු ලබන යම් ආකාරයට පළ කරනු ලැබිය යුතු ය.

ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබූ සහ සලකා බලනු ලැබූ අවස්ථාව සහ ආකාරය.

22. (1) යම් නිවේදනයක් මගින්, පැවැත්වීමට නියම කරන ලද ඉඩම් කච්චේරියක දී අන්සතු කරනු ලැබීමට යෝජිත ඉඩම් සඳහා දිසාපතිවරයා වෙත ඉල්ලුම් පත්‍ර එවනු ලැබිය යුතු දිනයක්, 21 වන වගන්තිය යටතේ නිවේදනයකින් දිසාපති වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) ඒ නිවේදනයෙහි, දිනයක් එසේ නියම කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ දිනයට පසු ඉඩම් සඳහා ලැබුණු යම් ඉල්ලුම් පත්‍රයක් භාර ගැනීමට හෝ සලකා බැලීමට ඉඩම් කච්චේරියක දී දිසාපති වරයා විසින් තම අභිමතය අනුව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) එසේ දිනයක් නියම නොකරන ලද අවස්ථා වක, ඉඩම් කච්චේරියේ දී හෝ ඒ ඉඩම් කච්චේරිය පැවැත්වීමට නියම කරන ලද දිනයට පෙර හෝ ලැබුණු සියලු ඉල්ලුම් පත්‍ර සලකා බැලීමට දිසාපති වරයා බැඳී සිටින්නේ ය :

එසේ වුව ද, (1) වන උපවගන්තිය යටතේ දිනයක් එසේ නියම නොකරන ලද අවස්ථාවක, ඉඩම් කච්චේරිය පැවැත්වීමට නියම කරන ලද දිනයට පෙර, දිසාපතිවරයා විසින් ඉල්ලුම් පත්‍ර භාර ගැනීම හෝ ඉල්ලුම් පත්‍ර කැඳවීම නීත්‍යානුකූල වන්නේ ය.

රජයේ ඉඩම් අන්සතු කරනු ලැබිය හැකි තැනැත්තන්.

22අ. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන තැනැත්තකු හැර වෙනත් යම් තැනැත්තකු වෙත කිසිම රජයේ ඉඩමක් අන්සතු කරනු නොලැබිය යුතු ය.

මේ වගන්තියෙහි ඉහතින් වූ විධිවිධාන කඩ කරන ලද යම් ඉඩම් අත්සතු කිරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේ ය.

ඉඩම් කච්චේරියේ දී දිසාපතිවරයා සතු බලතල.

23. (1) 22 වන වගන්තියේ සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර ඉඩම් කච්චේරියක දී දිසාපතිවරයා විසින් සලකා බැලීමෙන් පසු—

(අ) මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, නොපමාව නැතහොත් අනාගත දිනයක දී හෝ අනාගත දිනයකට පෙර, රජයේ ඉඩම් අත්සතු කරනු ලැබිය යුතු අයදුම්කරුවන් තෝරා ගැනීම; හෝ

(ආ) යම් ඉල්ලුම් පත්‍රයකට අදාළ මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තෝරා ගැනීමක් කිරීමේ දී, ඉඩම් කච්චේරියේ දී අත්සතු කිරීමට යෝජිත ඉඩම අසල පදිංචි තැනැත්තන් ගෙන් ලැබුණු ඉල්ලුම් පත්‍ර පිළිබඳව, දිසාපතිවරයා විසින් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දිසාපතිවරයා විසින් කරන ලද යම් තීරණයකට විරුද්ධව නියමිත ආකාරයෙන් කරන අභියාචනයක්, ඉඩම් කොම සාරිස්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ප්‍රතිශෝධනය කිරීම මඟින් වෙනස් කිරීමට ඉඩම් කොමසාරිස් වරයාට ඇති බලය.

23අ. ඉඩම් කච්චේරියක දී හෝ අන්‍යාකාරයකින් හෝ දිසාපතිවරයකු විසින් කරන ලද තීරණයක හේතුවෙන් ඉඩම් අත්සතු කිරීම සඳහා තමා තෝරා ගත් බව තැනැත්තකු වෙත දැනුම් දෙනු ලැබූ හෝ යම් ඉඩමක අවසරපත්‍ර දරන්නකු වශයෙන් තැනැත්තකු පදිංචිව සිටින හෝ අවස්ථාවක, ඉඩම් කොම සාරිස්වරයාගේ මතය අනුව, තෝරා ගැනීම මේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව කරනු නොලැබ ඇති නම්, ඒ තෝරා ගැනීම දැනුම් දෙනු ලැබූ දිනයෙන් හෝ ඒ තැනැත්තා ඒ ඉඩමේ පදිංචියට පැමිණි දිනයෙන් හෝ පසු එක් වර්ෂයක් ඇතුළත, ඉඩම් කොමසාරිස්වරයා විසින්, දිසාපතිවරයාගේ තීරණය, ප්‍රතිශෝධනය කිරීම මඟින් වෙනස් කරනු ලැබිය හැකි ය.

අත්සතු කිරීම ලාභියාගේ සුදුසුකම් තීරණය කිරීම සඳහා තෝරා ගැනීමේ දිනය වැදගත් දිනය වන බව.

24. (1) රජයේ ඉඩම් අවසර පත්‍රයක් හෝ ප්‍රදානයක් ලැබීමට තැනැත්තකු තෝරා ගනු ලබන දිනය, ඒ අවසරපත්‍රය හෝ ප්‍රදානය ලැබීමට ඒ තැනැත්තා යථා පරිදි සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා වැදගත් දිනය විය යුතු ය.

(2) අවසර පත්‍රයක් මත, තැනැත්තකු වෙත අන්සතු කරන ලද ඉඩම්, පසුව ඒ තැනැත්තා වෙතම ප්‍රදානයක් මත අන් සතු කරන ලද අවස්ථාවක, අවසරපත්‍රයක් මත ඒ ඉඩම ලැබීම සඳහා දිසාපතිවරයා විසින් ඒ තැනැත්තා තෝරා ගන්නා ලද දිනය, ඒ තැනැත්තා, ඒ ඉඩම ප්‍රදානයක් මත ලබා ගැනීමට යථා පරිදි සුදුසුකම් ලබා තිබේ ද නැද්ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා වැදගත් දිනය විය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය ඉවත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන, 49 වන, 68 වන, 72 වන, 105 වන සහ 172 වන වගන්තිවල "19අ වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාර වාර්ෂික මුදලක් ගෙවීමෙන්" යන යෙදුම වෙනුවට, "19 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික වාරිකයක් ගෙවීමෙන්" යන යෙදුම ආදේශ කිරීමෙන්, ඒ වගන්ති, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41, 49. 68, 72, 105 සහ 172 වන වගන්ති සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) ඒ ඉඩම් කොටස රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ලංකා සංවර්ධන මුදල් සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස කොමසාරිස්වරයා, ලියාපදිංචි කරනු ලැබූ යම් සංගමයක් හෝ වෙනත් නිශ්චිත ආයතනයක් නොවන යම් තැනැත්තකු වෙත උකස් කරනු නොලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය සංශෝධනය කිරීම.

"(1) 19 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් වාර්ෂික වාරික ගෙවීමට නියමිතව සිටි අවසර පත්‍ර දරන්නකු මියගිය විටක, ඒ වාරික ගෙවීම පැහැර හැරීම කෙසේ වුව ද, ඒ අවසරපත්‍ර දරන්නා විසින්, තම අනුප්‍රාප්තිකයා වශයෙන් නම් කරනු ලැබ තිබුණ ද, නොතිබුණ ද, අවසරපත්‍රය මත ඒ අවසරපත්‍ර දරන්නා වෙත අන්සතු කර දෙන ලද ඉඩමට අනුප්‍රාප්තවීමට ඔහුගේ හෝ ඇයගේ කලත්‍රයාට හිමිකම් තිබිය යුතු අතර, ඒ අවසරපත්‍රයේ නියම හා කොන්දේසි ඒ කලත්‍රයාට අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන සහ 85 වන වගන්ති සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන සහ 85 වන වගන්තිවල, "19අ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ කුලී ගෙවීමෙන්" යන යෙදුම වෙනුවට, "19 වන වගන්තිය යටතේ වාර්ෂික වාරික ගෙවීමෙන්" යන යෙදුම ආදේශ කිරීමෙන්, ඒ වගන්ති, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

112අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුලත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ඒ ප්‍රඥප්තියේ 112අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"අවලංගු කිරීමේ දී ඇනටමත් ගෙවා ඇති වාරික ආපසු ගෙවිය යුතු බව.

112අ. (1) 109 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ හෝ 110 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අවසරපත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථාවක, ඒ අවසරපත්‍රය මත දැනටමත් ගෙවා ඇති වාරික, දිසාපතිවරයා විසින්, අවසරපත්‍ර දරන්නා වෙත ආපසු ගෙවිනු ලැබිය යුතු ය.

(2) දිසාපතිවරයා විසින්, ඒ අවසරපත්‍රය යටතේ ඉඩමෙහි පදිංචිව සිටි කාලය සඳහා නියම කරනු ලැබිය හැකි අනුප්‍රමාණය අනුව ගණන් බලනු ලබන මුදල් ප්‍රමාණයක්, වාරික වශයෙන් ගෙවන ලද ඒ මුදල් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (ඔ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඔ) 19 වන වගන්තිය යටතේ වාර්ෂික වාරිකය ගෙවූ ද, තමාගේ අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ ද අවසර පත්‍ර දරන්නකු විසින් ගෙවන ලද වාර්ෂික වාරිකය ආපසු ගෙවීම;"; සහ

(ආ) ඒ වගන්තියේ (ඔ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඔඔ) 19 වන වගන්තියේ (5) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු වෙත අත් සතු කර දෙන ලද යම් ඉඩමක් වැඩි දියුණු කිරීමේ වියදම ආපසු අය කර ගත යුතු ආකාරය; සහ".

159අ සහ 159ආ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 159 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති, ඒ ප්‍රඥප්තියේ 159අ වගන්තිය සහ 159ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"මේ ආඥාපනත යටතේ අන් සතු කිරීම ලංගින්.

150අ. (1) මේ ආඥාපනත යටතේ යම් ඉඩමක් අන් සතු කර දෙනු ලැබූ සෑම තැනැත්තකුට ම එකී ඉඩම එසේ නියම කරනු ලැබිය හැකි වූ කාලයක් ඇතුළත දී මිළයට ගැනීමේ සහ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ එම ඉඩම ප්‍රදානයක් ලෙස ලබා ගැනීමේ අයිතිය තිබිය යුතු ය.

(2) එවැනි තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු වූ මුදල් ප්‍රමාණය, ඉඩමේ අගය සැලකිල්ලට ගෙන, ඉඩම් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනත යටතේ අත් කර ගන්නා ලද්දා වූ ද මෙම ආඥාපනත යටතේ ප්‍රදානයක් වශයෙන් හෝ අවසර පත්‍රයක් යටතේ හෝ ලබාගන්නා ලද්දා වූ ද ඉඩම සම්බන්ධයෙන් අදාළ විය යුතු විශේෂ විධිවිධාන.

159ආ. 1942 අංක 61 දරන ඉඩම් නිදහස් කිරීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ අත් කරනු ලැබ, මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් හෝ ප්‍රදානයක් මත ඉඩම් දරනු ලැබූ අවස්ථාවක, 159 වන වගන්තිය යටතේ ඒ ඉඩම් අන් සතු කර දීමේ ප්‍රදානයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) ප්‍රදානය නියමිත ආකෘති පත්‍රයෙහි විය යුතුය ;

(ආ) මේ ආඥාපනතේ VII වන පරිච්ඡේදය එවැනි ප්‍රදානයක් මත දරනු ලබන ඉඩම කට අදාළ නොවිය යුතු ය; තවද

(ඇ) ප්‍රදානය, රජයේ ඉඩම් ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ නියත වශයෙන් කරන ලද ප්‍රදානයක් ලෙස බලපැවැත්විය යුතු අතර, එම ආඥාපනතේ විධිවිධාන, ඒ ප්‍රදානය යටතේ ඉඩම් ලාභියාගේ අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතාවන් කෙරෙහි අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 166 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 166 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"රජයේ නිලධරයන් ආරක්ෂා කිරීම.

166. මේ ආඥාපනත යටතේ යම් රජයේ නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කිරීම පැහැර හරින ලද කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය".

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කිරීම.

13. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ආරක්ෂා කිරීම.

14. (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කර ඇතද, යම් තැනැත්තකු ඒ පනත යටතේ අවසරපත්‍ර දරන්නකු වන අවස්ථාවක දී සහ ඒ අවසර පත්‍රය, ඒ පනතේ 27 වන වගන්තිය යටතේ අවලංගු කර නොමැති අවස්ථාවක දී, එසේ අන්සතු කර දෙන ලද ඉඩමේ සන්තකය ඔහු විසින් දරන්නා වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවසරපත්‍ර දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 43 දරන රජයේ ඉඩම් විකිණීමේ (විශේෂ විධිවිධාන) පනත ඉවත් කර ඇත ද, යම් තැනැත්තකු ඒ පනත යටතේ ප්‍රදානයක් දරන්නකු වන අවස්ථාවක, ඔහු, එසේ අන්සතු කර දෙන ලද ඉඩමේ සන්තකය දරන්නා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ප්‍රදානයක් දරන්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.